**වැලිකන්ද ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 ව්‍යාවනය කළ මතය**

වැලිකන්ද ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

**1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් සභාව වෙත ලබාදී තිබුණු රු.171,607 ක් වූ ගැල්වනයිස් කොඩිකණු 155 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කරන බව. | සභාවට අයත් වත්කම් ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරි තොග වටිනාකම රු.217,089 ක් වැඩියෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු සිදුකරනු ලබන බව. | ඉතිරි තොගය නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී දිඹුලාගල ප්‍රාදේශීය සභාවෙන් ලැබී තිබුණු වර්තමාන වෙළඳපොළ වටිනාකම රු. 1,793,300 ක් වූ ජලනල උපකරණ තොගයේ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | උපකරණ තොගයේ වටිනාකම ලබාදී නොමැති බැවින් පොත්වලට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බව. | සියලු වත්කම් අගය ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ 2019 වර්ෂයේදී රු.2,000,000 ක් වැයකර සංවර්ධනය කර සභාව වෙත ලබාදී තිබුණු ප්‍රාදේශීය සභාවේ සංචාරක බංගලාව ලෙස භාවිතා කරන ගොඩනැගිල්ල ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රතිසංස්කරණයේ ගැටළුවක් පවතින බැවින් නීත්‍යානුකූලව සභාවට භාරගෙන නොමැති නිසා ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොමැති බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදන සැලසිය යුතුය. |
| (ඊ) | සභාවේ ආදායම් පරීක්ෂකවරයා විසින් සමාලෝචිත වර්ෂය තුළ ක්ෂේත්‍රයේ රැස්කර සහා අරමුදලට බැර කර නොමැති බවට හඳුනාගත් රු.1,984,605 ක මුදල් හා ඒ | අදාළ ලදුපොත් විගණනයෙන් ඉල්ලා සිටියද, ආපසු නොලැබීම නිසා එම මුදල අනාවරණය කර ගැනීමට | දෛනික ආදායම් එදිනම හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හේතුවෙන් ආදායම් විෂයයට වූ බලපෑම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් කර නොතිබුණි. | නොහැකි වූ බව. | |
| (ඪ) | 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව වෙත ලැබී තිබුණු ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 13 ක් ඩෙක්ස්ටොප් පරිගණක යන්ත්‍ර 01 ක් හා ප්‍රින්ටර් 02 ක වටිනාකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල වත්කම් යටතේ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | වටිනාකම් සමඟ භාරදීමට කටයුතු කර නොතිබුණු නිසා ගිණුම්ගත නොකළ බව. | වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඬ) | සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම රු.3,103,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වර්ෂයේ ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.220,805,047 ක් වූ ගිණුම් ශේෂ 05 ක් ශේෂ සනාථ කිරීම්, උපලේඛන සහ සැසඳුම් වාර්තා විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | සියලු ලේඛන ඉදිරිපත් කළ බව. | උපලේඛනය, ශේෂ සනාථ කිරීම් සහ සැසඳුම් වාර්තා ඉදිරිපත් කළ යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| XXVIII පරිච්ඡේදයේ 31 වගන්තිය | 2021 වර්ෂයේ ගිවිසුම්ගත මුදලින් සියයට 50 බැගින් අඩුකර 2022 වර්ෂය සඳහා ටෙන්ඩරය ලබාදීම සුදුසු බවට 2022 ජනවාරි 18 දින පැවති මහා සභාවේ 5.2.13 යටතේ සම්මත වූ යෝජනාවක් බවට දක්වමින් කූට ලේඛනයක් සකස් කර ඇති බව නිරීක්ෂණය විය. | සභා අරමුදලට අයවිය යුතු ආදායමක් අහිමි කර නොමැති බව. | සභාවේ සම්මත නොවූ කරුණක් පසුව සම්මත වූ කරුණක් ලෙස ලේඛන සකස් කර ඇති බවට විගණනයේදී සනාථ කරන සාක්ෂි ලැබී ඇති බැවින් ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්ම වූ වියදම රු. 6,647,841 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්ම වූ අයහාරය රු. 9,894,878 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය පුරා සභා අරමුදලේ ශේෂය රු.මි. 27 ත් රු.මි. 57 ත් අතර පැවති අතර, අතිරික්ත මුදල් කොටසක් මහජන බැංකුවේ සාමාන්‍ය ඉතුරුම් ගිණුමක රඳවා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය පුරා පැවති ස්ථාවර තැන්පතු ඉහළ පොළී අනුපාත මත අතිරික්ත මුදල් කෙටි කාල පරිච්ඡේද වශයෙන් හෝ ආයෝජනය කිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොතිබුණි. | පිළිගෙන ඇත. | අතිරික්ත මුදල් (කෙටිකාලීනව) ආයෝජනය කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
| --- | --- | --- | --- | --- | --- | --- | --- | --- | --- |
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 787,400 | 389,400 | 389,400 | - | 1,253,800 | 556,410 | 556,410 | - |
| (ii) | කුලී | 8,558,916 | 4,284,700 | 2,534,125 | 5,478,753 | 6,441,547 | 7,987,528 | 4,273,800 | 3,713,728 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 488,650 | 189,282 | 189,281 | 774,845 | 697,650 | 157,035 | 157,035 | 774,645 |
| (iv) | වෙනත් ආදායම් | 8,544,000 | 11,074,183 | 9,300,000 | 12,035,401 | 18,120,000 | 32,848,155 | 25,510,004 | 7,338,151 |
| | | 18,378,966 | 15,937,565 | 12,412,806 | 18,288,999 | 26,512,997 | 41,549,128 | 30,497,249 | 11, 826,524 |

#### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කැලි කසල බදු ආදායම රු.438,000 ක් හා | මුදල් අයකර ගැනීමට අවශය කටයුතු සිදුකරමින් | කසළ රැස්කිරීම අනුව ගාස්තු අය කළ යුතුය. |

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ආරම්භක හිඟය රු.311,300 කින් වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.55,150 ක් විය. | පවතින බව. | |
| **(ආ)** | **කුලී** | | |
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත කඩ කුලී ආදායම රු.2,331,600 ක් හා ආරම්භක හිඟය රු. 2,696,897 ක් වශයෙන් රැස්කිරීමට අපේක්ෂා කර තිබූ රු.5,028,497 ක ආදායමින් සමාලෝචිත වර්ෂයේදී රැස්කර තිබූ ආදායම රු.544,700 ක් විය. | මේ වන විට හිඟ ආදායමින් කොටසක් ලබාගැනීමට කටයුතු සිදුකර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2022 ජනවාරි 01 දිනට මාස 08 සිට 70 දක්වා වූ කඩහිමියන් 33 කගෙන් අයවිය යුතු හිඟ හිටි කඩ කුලිය රු.2,028,261 ක් වූ අතර, ඒ සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | පැවති තත්වය මත මුදල් එකතු කිරීමට ආදායම් පරීක්ෂකවරයාට නොහැකි වූ බව. | -එම- |
| (ඇ) | වර්ෂ ගණනාවක සිට පැවත එන රු.1,016,831 ක වත්කම් බදු දීමේ (ටෙන්ඩර්) හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකර නොතිබුණි. | මේ වන විට ක්‍රමානුකූලව එම මුදල් අයකර ගැනීමට පියවර ගෙන ඇති බව. | ආදායම් පරිපාලක රැස්කරන ලද ආදායම සභාවට අයකර ගැනීමටත්, ඉතිරි හිඟ ආදායම් අයකර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| **(ඈ)** | **බලපත්‍ර ගාස්තු** | | |
| | සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති රු.774,645 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු ආදායම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි. | නව ආදායම් පරීක්ෂක විසින් විමර්ශනයක් කිරීමට කටයුතු කර ඇති බව. | හිඟ ආදායම් නිරවුල් කරගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **අතුරු ව්‍යවස්ථා** | | |
| | ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු පානීය ජලය විකිණීම, ගොඩනැගිලි තැනීම, පාරවල් සහ මංමාවත්, කුණු කසල ඉවත්කිරීම, විනෝද බදු, වැලි ප්‍රවාහන යන ප්‍රධාන කාර්යයන් 06 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | සභාව වෙත ඉදිරිපත් කර අනුමැතිය සඳහා යොමුකර ඇති බව. | අතුරු ව්‍යවස්ථා පනවාගත යුතුය. |

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් සභා බල ප්‍රදේශයේ දෛනිකව ජනනය වන කැලි කසල කළමනාකරණය සඳහා විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර. වර්ගීකරණයකින් තොරව රැස්කරනු ලබන කසල සේනපුර කොට්ඨාශයට අයත් ඇතුගල අක්කර 05 ක පමණ විවෘත භූමියකට බැහැර කර වසා දැමීම තවදුරටත් ක්‍රියාත්මක කරමින් පැවතුණි. | යෝජිත නෙළුම් වැව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ කටයුතු දැනට ආරම්භ කර ඇති බැවින් එයට සමගාමීව ඉදිරියේදී විධිමත් ඝන අපද්‍රව්‍ය සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව. | විධිමත් ඝන අපද්‍රව්‍ය කළමනාකරණයක් සිදුකළ යුතුය. |
| (ii) | සභාව විසින් 2021 වර්ෂයේදී නෙළුම්වැව ප්‍රදේශයේ රු.1,236,921 ක් වැයකර නොදිරන කසල රැස්කිරීමේ ගබඩාවක් ඉදිකර තිබුණු නමුත් නොදිරන කසල ගබඩා කිරීමට කටයුතු නොකර එම ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය පුරා නිෂ්කාර්යව පැවතුණි. | යෝජිත නෙළුම් වැව ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතිය තුළින් ඉදිරියේදී නොදිරන කසල අංගනය සක්‍රීය කිරීමට කටයුතු සැලසුම් කරන බව. | වත්කම් ස්ථාපනයේදී ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.1,412,901 ක් වූ ණයගිමි ශේෂ 09 ක් 2011 – 2018 අතර කාලයක සිට නිරවුල් නොකර මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙන එමින් පැවතුණි. | ඉදිරියේදී මෙම ශේෂ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේදී ප්‍රාදේශීය සභාව වෙත හිටපු රාජ්‍ය අමාත්‍යවරයෙකු වෙතින් ලැබී තිබුණු ලැප්ටොප් වර්ගයේ පරිගණක 12 ක්, ඩෙස්ක් ටොප් වර්ගයේ පරිගණකයක් හා පරිගණක ප්‍රින්ටර් 02 ක් විගණිත දිනය වූ 2023 පෙබරවාරි 23 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | සම්පත් දායකයෙකු බඳවා ගැනීමට නොහැකිවී ඇති නිසා පරිගණක සාක්ෂරතාවය දියුණු කිරීමේ වැඩසටහන් ආරම්භ කිරීමට නොහැකි වී ඇති බව දන්වා ඇත. | වත්කම් උපයෝජනය සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) | සෙවනපිටිය බහුකාර්යය ගොඩනැගිල්ල පුස්තකාලයක් බවට නවීකරණය කර, ඒ තුළ විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානයක් ඇති කිරීම සඳහා සභාව විසින් විවිධ ප්‍රභවයන්ගෙන් 2021 වර්ෂයේදී රු.2,856,456 ක අරමුදල් රැස් කරගෙන | පිළිගෙන ඇත. | අදාළ අරමුණු ඉටුකරගත යුතුය. |

තිබූ නමුත්, 2022 දෙසැම්බර් 12 වන දින වන විටත් අදාල අරමුණ ඉටුකරගෙන නොතිබුණි.

### 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු හා අතිරික්ත** | | |
| 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 40 ක් වූ අතර, ස්ථිර කාර්ය මණ්ඩලයේ 29 දෙනෙකු හා අනියම් සේවකයන් 09 දෙනෙකු මගින් රාජකාරි ආවරණය කරගෙන තිබුණි. ස්ථිර කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 11 ක් විය. | ඉහළ කළමනාකරණයෙන් ඉල්ලීම් කර ඇතත් මේ වන තෙක් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දන්වා ඇත. | අදාළ පාර්ශවවල අවදානයට යොමුකළ යුතුය. |